// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2037/17 - 2017 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද (2016 දෙසැම්බර් මස 01 වැනි දින අංක 1995/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) 1999 අගෝස්තු මස 17 වැනි දින අංක 1093/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඉහත කී නියමයේ උපලේඛනයේ 1 වන තීරයේ දැක්වෙන ''ව්‍යවහාරික විද්‍යා පීඨය'' යන සටහන සහ 2 වන තීරයේ ඊට අනුරූප සටහන් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

| '' *1 වන තීරය* | *2 වන තීරය* |
|---|---|
| ව්‍යවහාරික විද්‍යා පීඨය | කාර්මික කළමනාකරණ අධ්‍යයන අංශය ;<br>ඉලෙක්ට්‍රොනික් විද්‍යා අධ්‍යයන අංශය ;<br>ගණිත විද්‍යා අධ්‍යයන අංශය ;<br>පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයන අංශය.'' |

1A - PG 3699 — 508 (2017/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) ඉහත කී නියමයේ උපලේඛනයේ 1 වන තීරයේ දැක්වෙන ''වෛද්‍ය පීඨය'' යන සටහන සහ 2 වන තීරයේ ඊට අනුරූප සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

| '' *1 වන තීරය* | *2 වන තීරය* |
| --- | --- |
| තාක්ෂණ පීඨය | යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයන අංශය ;<br>විද්‍යුත් තාක්ෂණ අධ්‍යයන අංශය ;<br>ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයන අංශය ;<br>නැනෝ විද්‍යා තාක්ෂණ අධ්‍යයන අංශය.'' |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10-100

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.